2024.08.02

දයාබර ශිෂ්‍යාවනි,

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ පළමු වසරේ ශිෂ්‍යාවක වන ඔබ විසින් ශිෂ්‍ය හා ශිෂ්‍ය හා සුභසාධන අංශය වෙත ප්‍රාදේශීය ලේකම් මගින් සහතික කර ලියාපදිංචි තැපෑලෙන් එවන ලද නේවාසිකාගාර අයදුම්පත්‍රය මෙතෙක් අප වෙත ලැබී නැත. එබැවින් නිත්‍ය නේවාසික පහසුකම් හිමිවන ශිෂ්‍යාවන්ගේ නාම ලේඛනය සකසන තෙක් <u>2024.08.06</u> දින සිට **<u>තාවකාලිකව</u>** ඔබට කාන්තා නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් ලබා දෙන බව මෙයින් දන්වමි.

1) **ශ්‍රී පාලි මණ්ඩප කාන්තා නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් සැපයිය හැක්කේ ඉතා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවකට පමණි.** එබැවින් <u>නිත්‍ය නේවාසික පහසුකම් හිමිවන ශිෂ්‍යාවන්ගේ නාම ලේඛනය ප්‍රකාශ කිරීමෙන් පසු එහි ඔබගේ නම සඳහන් වන්නේ නම් ඔබට තවදුරටත් මෙම නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් හිමිවන අතර එසේ නොවුනහොත් අප විසින් දන්වන දිනක දී ඔබ නේවාසිකාගාරයෙන් ඉවත් විය යුතුය.</u>

2) ඔබට තාවකාලිකව නේවාසිකාගාර පහසුකම් සපයන කාල සීමාව සඳහා ගාස්තු වශයෙන් රු.1,000/- ක මුදලක් ගෙවිය යුතු වේ. මෙම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හොරණ ලංකා බැංකුවේ 0000719939 අංක දරණ රැස් කිරීමේ ගිණුමට බැර කර රිසිට් පත නේවාසිකාගාර උපශාලාධිපතිනිය වෙත ඉදිරිපත් කිරීමෙන් නේවාසිකාගාර සඳහා තාවකාලිකව ලියාපදිංචි විය හැකි බව මෙයින් දන්වා සිටිමි.

3) මෙම නේවාසික පරිශ්‍රයේ අනෙක් වසරවල ඉගෙනුම ලබන ශිෂ්‍යාවන්ට ද නේවාසික පහසුකම් ලබා දී ඇත. එබැවින් අනෙක් ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතුවලට බාධා නොවන අයුරින් කටයුතු කිරීමට වග බලා ගත යුතුය. නේවාසිකාගාර පරිශ්‍රය තුලදී හෝ ඉන් පිටතදී කිසිදු විෂමාචාර ක්‍රියාවක නිරත වීම සපුරා තහනම් වේ. **<u>ඔබ එවැනි යම් විශමාචාර ක්‍රියාවක නිරත වී ඇති බව තහවුරු වුවහොත් ඒ අවස්ථාවේදීම ඔබගේ නේවාසිකාගාර පහසුකම අහෝසි කරනු ඇත.</u>**

4) නේවාසිකාගාර සම්බන්ධයෙන් අනුගමනය කලයුතු නීති රීති ශ්‍රී පාලි මණ්ඩප ශිෂ්‍ය අත්පොතෙහි (2024) සඳහන් වන අතර ඒ අනුව ඔබ කටයුතු කළයුතුය.

5) ඔබට ලබා දී ඇති නේවාසික පහසුකම් ඔබ විසින් පිළිගනු ලැබීම මගින් ඔබ 2001 අංක 01 දරණ විනය පිළිබඳ අනු නීතියේ ප්‍රතිපාදනවලින් සහ විශ්වවිද්‍යාලයේ වෙනත් නීති රීතිවලින් බැඳෙන බැව් සිහියේ තබා ගත යුතුය. මීට පටහැනිව ක්‍රියා කළහොත් හෝ නේවාසිකාගාරය තුළ ගැටුම්කාරී තත්වයක් උද්ගත කළහොත්, නේවාසිකාගාර පහසුකම් ඒ අවස්ථාවේදීම විශ්වවිද්‍යාලය විසින් අහෝසි කරනු ලබන බවත් නීත්‍යානුකූලව අවශ්‍ය පියවර ගන්නා බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

මණ්ඩපාධිපති<br>ශ්‍රී පාලී මණ්ඩපය

---

මණ්ඩපාධිපතිතුමා<br>ශ්‍රී පාලී මණ්ඩපය

ඉහත සඳහන් තොරතුරු හොඳින් කියවා බලා තේරුම් ගෙන අදාළ කොන්දේසිවලට යටත්ව, නේවාසිකාගාර පහසුකම් ලබා ගන්නා බවටත්, යම් විනය විරෝධී ක්‍රියාවක නිරත වූ බව තහවුරු වුවහොත් විශ්වවිද්‍යාලයේ තිරණයට එකඟව නේවාසිකාගාරයෙන් ඉවත් වන බවටත් මෙයින් පොරොන්දු වෙමි.

අත්සන - ........................................................ දිනය ......................................

නම - ..................................................................................................................

ශිෂ්‍ය ලියාපදිංචි අංකය - ........................................................